## මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි 2021 සිව්වන කාර්තුව අවසන් වන විට ප්‍රගතිය

එක් එක් රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු හා දත්ත පදනම් කරගෙන ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ සිව්වන කාර්තුව අවසන් වනවිට සකසන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි සමුච්චිත භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාව මේ සමඟ ඇති සබැඳිය යටතේ දක්වා ඇත (https://www.treasury.gov.lk/web/dpmm-progress-of-projects /section/2021). එම වාර්තාවට අනුව, 2021 වර්ෂයේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1, 000 ඉක්මවන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 325 ක් රේඛීය අමාත්‍යාංශ 47 ක් යටතේ ක්‍රියාත්මක වන අතර ඒවායේ  නිම කිරීම් වර්ෂයන් 2030 වර්ෂය තෙක් පැතිර පවතී. ඒතුල සෞභාග්‍යයේ දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුව රජයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්හි ඉලක්ක අපේක්ෂිත පරිදි ලඟා කර ගැනීමේ අරමුණ පෙරදැරිව නව ව්‍යාපෘති 98 ක් 2021 වර්ෂයේදී ආරම්භ කර ඇත.

එන්නත්කරණය වේගවත් කරමින් සංචරණ සීමා හා වසංගත නීති රීති  ලිහිල් කිරීම තුළින් රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග රටේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්වයට පත්කිරීම කෙරෙහි සාධනීය බලපෑමක් ඇති කලද, ආනයන හා විදේශ විනිමය සීමා, ඉදිකිරීම් අමුද්‍රව්‍ය හිඟකම සහ විශේෂයෙන් ප්‍රසම්පාදන කටයුතුවල ඇතිවූ ප්‍රමාදයන් හේතුවෙන් ඉහත සාධනීය තත්ත්වය සංවර්ධන ව්‍යාපෘති සුමටව ක්‍රියාත්මකවීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, සියළුම සංවර්ධන ව්‍යාපෘති සඳහා 2021 වර්ෂයේ රු. බිලියන 806 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයෙන් 68% (රු. බිලියන 549) උපයෝජනය වී ඇති අතර වර්ෂය තුළ පැවති අභියෝගාත්මක තත්ත්වය තුළ ලබා ඇති මෙම මූල්‍ය ප්‍රගතිය සාධනීය තත්ත්වයකි.

තවද, වර්ෂයේ පසුගිය කාර්තු හා සැසඳීමේදී බහුතරයක් ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රගතිය සැලකිය යුතු ලෙසින් වර්ධනයක්  නොපෙන්වයි. අපේක්ෂිත භෞතික ප්‍රගතියෙන් 50% ක් පමණවත් අත්පත් කර ගැනීමට නොහැකි වූ ව්‍යාපෘති **65** ක් ඇත. මේ හැර,  2021 වර්ෂයේ අවසන් කළ යුතුව තිබූ ව්‍යාපෘති 89 න්  නිම කළ හැකි වූයේ ව්‍යාපෘති 32 ක් පමණක් වන අතර ව්‍යාපෘති 15 ක් මේ දක්වා අත්කරගෙන ඇත්තේ 50% ටත් වඩා අඩු ප්‍රගතියකි. සමාලෝචිත කාර්තුව තුළ ඇතැම් ව්‍යාපෘතීන්හි ප්‍රගතියක් නැති තරමය.

කෙසේවුවද,  සංවර්ධන ප්‍රතිඵල අපේක්ෂිත පරිදි ලබා දීම සඳහා බලපාන නොවිසඳී පවතින ඉඩම් අත්පත් කරගැනීමේ හා වන්දි ගෙවීමේ ප්‍රමාදයන්, ප්‍රතිපාදන ඌණතා හා අක්මුදල් ප්‍රමාදයන්, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සහ තෙවන පාර්ශවයන්ගේ අනුමැතිය හා සහාය ප්‍රමාදවීම යනාදී ගැටළු රාශියක් ව්‍යාපෘති වල පවතී. එබැවින්, නිරන්තරයෙන් පැන නගින මෙම ගැටළු නොපමාව විසඳා ගනිමින් අපේක්ෂා කළ පරිදි සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පහත දැක්වෙන පියවර ගැනීමට දන්වා ඇත.

- එක් එක් අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක වන ඌණ ප්‍රගතියක් සහිත අර්ධ වශයෙන්  නිම කර ඇති ව්‍යාපෘතිවල ඉදිරි පිරිවැය අවශ්‍යතාවය පිළිබඳ විශේෂ ඇගයීමක් සිදු කර, ව්‍යාපෘතීන්හි අඛණ්ඩභාවය තීරණය කිරීම සඳහා CRIP ( Committee to Resolve Issues in Projects) කමිටුවට යොමු කිරීමට
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් දැනට සකස් කරමින් පවතින ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගත හැකි ව්‍යාපෘති යෝජනා ඇතුළත් දස අවුරුදු ආංශික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට
- ව්‍යාපෘතිවල කඩඉම් සහ ප්‍රධාන කාර්යසාධක පදනම් කරගෙන සංවර්ධන ව්‍යාපෘතිවල සමස්ත කාර්යමණ්ඩලයන්හි වැටුප් හා දීමනා ලබා දීම සඳහා යෝග්‍ය මාර්ගෝපදේශ, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කිරීමට